**ශීර්ෂය 123 - නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය **123** - නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ **2023** දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය**,** එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත **2023** දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2024 මැයි 31 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 ජූනි 25 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම**,** විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්**,** වියදම්**,** වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරි සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළ දී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

| **ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව** | **ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශය** | **මෙම වාර්තාවේ ඡේද යොමුව** |
|---|---|---|
| 2.1 (අ) | මුදල් රෙගුලාසි 50(ii) ප්‍රකාරව ඇස්තමේන්තු හැකිතාක් දුරට සම්පූර්ණයෙන් නිවැරිදිව පිළියෙල කල යුතුය. | 2.1(අ) |
| 2.1 (ඇ) | -එම- | 2.1(අ) |

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

**(අ) පුනරාවර්තන වියදම් හා මූලධන වියදම්**

| **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්විම** | **නිර්දේශය** |
|---|---|---|
| නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය යටතේ පැවති වතු නිවාස අංශය **2023** ජනවාරි **19** දිනැති අංක **2315/35** දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් ජල සම්පාදන සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය **(166)** ලෙස වෙනම අමාත්‍යාංශයක් බවට පත්කර තිබුණි. එහෙත් එම නව අමාත්‍යාංශයේ මූලධන හා පුනරාවර්තන වියදම් ලෙස රු.මිලියන **1092.9** ක් මෙම අමාත්‍යාංශයේ වියදම් ලෙස ගිණුම් ගත කර තිබුණි. එබැවින් නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ වියදම රු.මිලියන **1,092.9** කින් අධිගණනය වී තිබුණි. | **2023** වර්ෂයට අයවැය ප්‍රතිපාදන අනුමත වූ පසු අතිවිශේෂ ගැසට් පත්‍රය අනුව මෙම අමාත්‍යාංශය යටතේ පැවති වතු නිවාස විෂය පථය ජල සම්පාදන අමාත්‍යාංශය වෙත මාරු වන ලදී. ඒ අනුව වතු යටිතල විෂය පථයට අදාල අයවැය ප්‍රතිපාදන මු.රෙ. **208** යටතේ ජල සම්පාදන අමාත්‍යාංශය වෙත මාරු කර දෙන ලෙස මහා භාණ්ඩාගාරයේ අයවැය දෙපාර්තමේන්තුව විසින් උපදෙස් ලබා දී ඇත. ඒ අනුව එම වියදම් මෙම අමාත්‍යාංශයේ වැය ශීර්ෂය යටතේ ගිණුම්ගත වී ඇත. | ගිණුම් නිවැරදිව පිළියෙළ කල යුතු බව. |

**(ආ) දේපල පිරියත හා උපකරණ**

| **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 2023 දෙසැම්බර් 31 දිනට යාපනය නගර ශාලාව ඉදිකිරීමේ මුළු පිරිවැය රු. මිලියන 1,636.15 ක් වුවද මූල්‍ය නොවන වත්කම් වාර්තාවේ කාණ්ඩ අංක **9160** යටතේ යාපනය නගර ශාලාව ඉදිකිරීමේ ව්‍යාපෘතියේ පිරිවැය රු. මිලියන **1,382**.61 ක් ලෙස දැක්වීමෙන් මූල්‍ය නොවන වත්කම් වටිනාකම රු.මිලියන **253.54** ක් අඩුවෙන් දක්වා තිබුණි. | මුදල් අමාත්‍යාංශය සමග සාකච්ජා කර එම වෙනසට අදාල වත්කම් ගිණුම්ගත කිරීමට සැලසුම් කර ඇත. | ගිණුම් නිවැරදිව පිළියෙළ කල යුතු බව**.** |

**(ඇ) කුලී හා වැඩ අත්තිකාරම් සහ කුලි හා වැඩ අත්තිකාරම් සංචිත ගිණුම**

| **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| කොන්ත්‍රාත්කරුවන් 05 දෙනෙකුට ගෙවන ලද රු. මිලියන 254.18 ක් ගිණුම්ගත කර නොතිබුණි. කුලී හා වැඩ අත්තිකාරම් ගිණුමට හා කුලී හා වැඩ අත්තිකාරම් සංචිත ගිණුමට කලයුතු ගැලපීම් සිදුකර නොතිබිම හේතුවෙන් එකී ගිණුම්වල ශේෂය අඩුවෙන් දැක්වුණි. | වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම්, කුලී හා වැඩ අත්තිකාරම් ගිණුම්වලට ගැලපීමට උපදෙස් ලැබී නොමැති බැවින් ගිණුම්ගත නොකරන ලදී. | ගිණුම් නිවැරදිව පිළියෙල කල යුතු බව. |

**(ඇ) විගණනය සඳහා සාක්ෂි නොවීම**

| | **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (i) | රු. මිලියන 356.66ක බැරකම් සනාථ කිරීම සඳහා ලේඛන ඉදිරිපත් කර නොතිබුණි. එම වටිනාකම සමස්ථ බැරකම් වටිනාකමින් සියයට 25 ක් විය. | 2023.12.31 දිනට අදාලවන බැරකම් එම දිස්ත්‍රික් ලේකම් කාර්යාල විසින් අමාත්‍යාංශයේ වැය ශීර්ෂයට අදාල බැරකම් වශයෙන් ඇතුලත් කර ඇත. එම නිසා එම බැරකම් අමාත්‍යාංශයේ බැරකම් ලේඛනයේ යාවත්කාලීන වීමක් සිදු කර නැත. | බැදීම් හා බැරකම් සනාථ කිරීම සඳහා මු.රෙ. 214 ප්‍රකාරව බැරකම් පිළිබඳ ලේඛන පවත්වා ගත යුතු බව. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි අංක **50 (ii)** සිට **(iv)** රෙගුලාසි ප්‍රකාරව වියදම් ඇස්තමේන්තු හැකිතාක් දුරට සම්පූර්ණයෙන්, නිවැරදිව පිළියෙල කිරීමට ගණන්දිමේ නිලධාරියා වගබලා ගත යුතු වුවත් අමාත්‍යාංශය විසින් ඒ අනුව කටයුතු කර නොතිබුණු අවස්ථා පහත දැක්වේ. | | |
| (i) | පුනරාවර්ථන වැය විෂයයන් 13 ක් යටතේ ප්‍රතිපාදිත රු.මිලියන 314.26 ක් සහ ප්‍රාග්ධන වැය විෂයයන් 20 ක් යටතේ ප්‍රතිපාදිත රු.මිලියන 3,460.3 ක ප්‍රතිපාදන වලින් සියයට 40 සිට සියයට 99 අතර පරාසයක එනම් පිළිවෙලින් රු.මිලියන 606.53 ක් හා රු.මිලියන 2,961.75 ක් ලෙස එකතුව රු.මිලියන3,568.28 ක් ඉතිරි වී තිබුණි. | මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති පුනරාවර්තන ප්‍රතිපාදන 6% කින් කපා හැරීම හා අංක 01/2023 අයවැය චක්‍රලේඛයේ 07 ජේදය මගින් දක්වා ඇති උපදෙස් හා පනවා ඇති සීමාවන් අනුව කටයුතු කිරීම, විදේශ රාජ්‍යයන්ගේ එකගතාවයන් මත වියදම් දැරීමට සිදුවි ඇති සමහර ප්‍රාග්ධන ව්‍යාපෘතිවල ප්‍රතිපාදන භාවිතා කිරීමට නොහැකි වීම මෙම ඉතිරිවීම් වලට හේතු විය. | අවශ්‍ය ප්‍රතිපාදන නිවැරදිව පුරෝකථනය කල යුතු බව. |
| (iii) | පුනරාවර්තන වැය විෂයයන් 05 ක් වෙත ප්‍රතිපාදිත එකතුව රු.මිලියන 5,055 ක මුදලින් රු.මිලියන 2,476.73 ක් එනම් සියයට 38 සිට 84 දක්වා ඉහල ප්‍රතිශතයක මුදල් ප්‍රතිපාදන වෙනත් වැය විෂයයන් වෙත මාරු කර තිබුණි. | අංක 01/2023 අයවැය චක්‍රලේඛයේ 07 ජේදය මගින් දක්වා ඇති උපදෙස් හා පනවා ඇති සීමාවන් අනුව කටයුතු කිරීම මෙම ඉතිරිවීම් වලට හේතු විය. | අවශ්‍ය ප්‍රතිපාදන නිවැරදිව පුරෝකථනය කල යුතු බව. |
| (ආ) | මු.රෙ.**66** මගින් වැය විෂයයන් **03** ක් සඳහා මාරු කරගෙන තිබුණු රු.මිලියන **13.88** ක මුළු මුදලම අදාල කාර්යය සඳහා වැය නොකර ඉතිරි කර තිබුණි. | අපේක්ෂිත බිල්පත් පියවීම සඳහා මු.රෙ. **66** මගින් ප්‍රතිපාදන සලසා ගත්තත් එම බිල්පත් එම වර්ෂය තුළ නොලැබීම | අවශ්‍ය ප්‍රතිපාදන නිවැරදිව පුරෝකථනය කල යුතු බව. |

## 2.2 බැරකම් හා බැදීම්වලට එළඹීම

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ව්‍යාපෘති දෙකක් විසින් ඇතිකරගෙන තිබූ රු.4672.76ක බැරකම් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරවු කර නොතිබුණි. | එම ව්‍යාපෘතිවලට වාර්ෂිකව වෙන්වන මුල්‍ය ප්‍රතිපාදන තුළ එම බිල්පත් බැරකම් ප්‍රකාශයට ඇතුළත් කිරීම සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන වෙන්කර දීමක් සිදුනොවන බැවින් බැරකම් වශයෙන් බැරකම් ප්‍රකාශයට ඇතුළත් කිරීමේ හැකියාවක් නොමැති බව පෙන්වා දීමට කැමැත්තෙමි. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව **2023** දෙසැම්බර් **31** දිනට අමාත්‍යාංශයේ සියළු බැරකම් පෙන්විය යුතු බව. |
| (ආ) | නාගරික පුනර්ජීවන ව්‍යාපෘතිය සඳහා මහජන බැංකුවෙන් ලබාගෙන තිබු ණය මුදල ගෙවීමේ ප්‍රමාදය මත රු.මිලියන **2** ක දඩ මුදලක් අයකිරීමට බැංකුව විසින් තීරණය කර තිබුණි. එය අමාත්‍යාංශය විසින් ගෙවිය යුතු මුදලක් වන බැවින් එය බැදීම් හා බැරකම් යටතේ හෙළිදරවු කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙම මුදල වියදම් කරන ලද ආකාරය තහවුරු කිරීමට අදාල ලිඛිත සාක්ෂි **2024/05/29** දින විගණනයට ඉදිරිපත් කරන ලදි. | අමාත්‍යාංශය විසින් ගෙවිය යුතු මුදල් බැදීම් හා බැරකම් යටතේ හෙළිදරවු කිරීමට කටයුතු කල යුතු බව. |

## 2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| | නිරීක්ෂණය | | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | **නීති,රීති හා රෙගුලාසි වලට යොමුව** | **වටිනාකම රු.මි.** | **අනුකූල නොවීම** | | |
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | | | | |
| (i) | VII වැනි පරිච්ඡේදයේ 12.2.1 ඡේදය | 1.32 | නිත්‍ය තනතුරට වඩා පහල තනතුරුවල වැඩබැලීම වෙනුවෙන් නිළධාරීන් 05 දෙනෙකු පත්කර ඔවුන් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 1.32 ක වැඩබැලීමේ දීමනා ගෙවා තිබුණි. | ව්‍යාපෘති සඳහා පත්කිරීම් සිදුකරනු ලබනුයේ 1/2019 කළමණාකරන සේවා චක්‍රලේඛ අනුව බැවින් එහි නියමයන්ට අනුව කටයුතු කර ඇත. | ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව කටයුතු කල යුතු බව. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ආ) | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 දරන මාර්ගෝපදේශ චක්‍රලේඛයෙහි (ඉ) හා (ඊ) ඡේද | 0.14 | වැඩතහනමට ලක්වූ සහ සේවය හැරගොස් තිබුණු නිලධාරීන් 02 දෙනෙකුගෙන් අයවිය යුතුව තිබුණු රු.මිලියන 0.14 ක ණයශේෂ වසර 05 සිට 10 දක්වා කාලයක් ගතව තිබුණද අයකර ගෙන නොතිබුණි. | එක් නිලධාරියෙකුගේ හිඟ ණය මුදල් ගෙවන ලෙසට දැනටමත් දැනුම් දී ඇති නමුත් අණය මුදල් ගෙවීම අපහසු බව වාචිකව දැනුම් දී ඇත. | අයවිය යුතු ශේෂ මාර්ගෝපදේශ ප්‍රකාරව අයකර ගත යුතු බව. |
| (ඇ) | SC&PMU/Grant/19 දරන 2019 ජූලි 25 දිනැති විදේශ සම්පත් දෙපාර්තමේන්තු චක්‍රලේඛය | ඇ.එ.ජ. ඩො. මිලියන 1 | මෙරටට ලැබෙන සියලුම විදේශ ප්‍රදාන හා ආධාර භාණ්ඩාගාර අනුමැතිය මත ලබාගත යුතු වුවද එසේ කටයුතු කර නොතිබුණි. | ඇමරිකානු ඩොලර් මිලියන 1.1 ක තාක්ෂණික සහය ප්‍රදානය සඳහා ශ්‍රී ලංකා රජය හා ආසියානු සංවර්ධන බැංකුව අතර කිසිඳු ගිවිසුමක් අත්සන් කර නොමැති බැවින් තාක්ෂණ ප්‍රදානය ගිණුම්ගත කිරීම සඳහා අමාත්‍යාංශයට හැකියාවක් නොමැති බව පෙන්වා දීමට කැමැත්තෙමි. | සියලුම විදේශ ප්‍රදාන හා ශිල්පීය ආධාර විදේශ සම්පත් දෙපාර්තමේන්තුව හරහා ලබා ගත යුතු බව. |

**2.4** **තැන්පත් ශේෂයන්**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අමාත්‍යාංශය යටතේ තැන්පත් ගිණුම් **15**ක් පැවති අතර ඒවායින් ගිණුම් **07** ක් අක්‍රිය තත්වයේ පැවතුණි. එම අක්‍රිය ගිණුම් අහෝසි කිරීමට කටයුතු කර නොතිබුණි. | එම ගිණුම් හත සඳහා ගණුදෙනු සිදු වනුයේ ඉතා විරල වශයෙනි. | අක්‍රිය ගිණුම් අහෝසි කිරීමට කටයුතු කල යුතු බව. |
| (ආ) | රු. මිලියන 1765.2 වටිනා එම තැන්පතු ශේෂ තහවුරු කර ගැනීම සඳහා කොන්ත්‍රාත් ලේඛන ඉදිරිපත් නොවුණි. | තැන්පත් ලෙජර් අනුව කොන්ත්‍රාත්වලට ගෙවිය යුතු තැන්පත් මුදල් ඊට අදාල ගොනු පරීක්ෂා කිරීම තුලින් තහවුරු කරගත හැකිය. | කොන්ත්‍රාත් ලේඛනයක් නඩත්තු කල යුතු බව. |

## 2.5 බැංකු ගිණුම් මෙහෙයවීම

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කොළඹ අගනගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතිය(**MCUDP**) හා උපාය මාර්ගික නාගරික සංවර්ධන ව්‍යාපෘතිය **(SCDP) 2022** දොසැම්බර් **31** දින වන විට අවසන්කර තිබූ නමුත් එම ව්‍යාපෘතීන්ට අදාල බැංකු ගිණුම් **2024** අප්‍රේල් **17** දිනය වන විටද ක්‍රියාත්මක තත්වයේ පැවතුණි. | එම බැංකු ගිණුමද වසාදැමීමට අවශ්‍ය පියවර ගැනීමට සැලසුම් කර ඇත. | අවසන්කරන ලද ව්‍යාපෘතීන්වලට අදාල බැංකු ගිණුම් වසා දැමීමට කටයුතු කල යුතු බව. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යභාරයන් ඉටු නොකිරීම

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| "සියක් නගර" නාගරික යටිතල පහසුකම් හා නගර අලංකරන වැඩසටහන යටතේ ක්‍රියාත්මක කිරීමට යෝජිත රු.මිලියන **717.20** ක වටිනාකමක් සහිත ව්‍යාපෘති **8** ක් අරමුදල් හිඟකම හේතුවෙන් ආරම්භ කර නොතිබුණි. | **NOR** කමිටුව විසින් අනුමැතිය ලබා දුන් ව්‍යාපෘති **7**ක් ආරම්භ කර දැනට කරමින් පවතී. | යෝජිත සංවර්ධන කටයුතු කාලීනව අවසන් කල යුතු බව. |

### 3.2 ප්‍රධාන කාර්යයන්ට පටහැනි ක්‍රියාකාරකම්

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සංශෝධිත ගිවිසුම අනුව හෝලුවාගොඩ කෘෂි පාරිසරික උද්‍යාන ව්‍යාපෘතිය 2021 අගෝස්තු 21 දින ආරම්භ කර 2023 අගෝස්තු 30 දින නිම කිරීමට සැලසුම් කර තිබුණු නමුත් 2023 දෙසැම්බර් 31 දින වන විට මෙම ව්‍යාපෘතියේ මුළු වියදම රු.මිලියන 450.56 ක් එනම් ගිවිසුම්ගත මුදල මෙන් සියයට 131 ක් වී තිබුණු අතර මෙම ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු ජාතික සැලසුම් | 65% කට වඩා වැඩ ප්‍රමාණයක් ඒ වන විට නිමකර තිබූ බැවින්, වැඩ නිම නොකිරීම මත ව්‍යාපෘතිය අතහැර දැමුවහොත් වන පාඩුව සලකා බලා මෙහි ඉදිකිරීම් කටයුතු 2023 දක්වා ක්‍රියාත්මක කරන ලදී. | විධිමත් අනුමැතියක් මත ව්‍යාපෘති ක්‍රියාත්මක කළ යුතු බව. |

| | | | |
|---|---|---|---|
| | දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතියකින්ද තොරව සිදුකර තිබුණි. | | |
| (ආ) | භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයෙකුගේ ප්‍රධානත්වයෙන් පත් කරනු ලැබ ඇති නිලධාරී කමිටුව විසින් කරන ලද නිර්දේශ අනුව, මෙම ව්‍යාපෘතියේ විෂයපථය ඉවත්කර පසුකාලීනව නිම කිරීම සඳහා කල් දැමීමට උපදෙස් ලබා දී තිබුණද විධිමත් අනුමැතියකින් තොරව උක්ත ව්‍යාපෘතිය **2023** වර්ෂය අවසන් වන විටද ක්‍රියාත්මකව පැවතුනි. | වැඩ නිම නොකිරීම මත ව්‍යාපෘතිය අතහැර දැමුවහොත් වන පාඩුව සලකා බලා මෙහි ඉදිකිරීම් කටයුතු **2023** දක්වා ක්‍රියාත්මක කරන ලදී. | විධිමත් අනුමැතියක් මත ව්‍යාපෘති ක්‍රියාත්මක කළ යුතු බව. |

**3.3 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | යුද්ධයෙන් අවතැන් වීම හේතුවෙන් සුභසාධක කඳවුරුවල රැඳී සිටින පුද්ගලයන් නැවත පදිංචිකිරීම සඳහා සහ යුද්ධයෙන් අවතැන් වී යාපනය දිස්ත්‍රික්කයේ කඳවුරුවල සිටින පවුල් **971** ක් වෙනුවෙන් නිවාස ලබාදීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාදී තිබුණද යුද්ධය නිමාවී වසර **14** ක් ගත වී තිබුණද නැවත පදිංචි කිරීමේ කටයුතු ක්‍රමවත්ව සිදුකර අවසන් කර නොතිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විටත්, සුභසාධක කඳවුරුවල අවතැන් වූවන් රැඳී සිටින අතර එම කඳවුරු නඩත්තුව හා ජලය සැපයීම වෙනුවෙන් ප්‍රවර්ථන වර්ෂය දක්වා රු.මිලියන **16.78** ක් අමාත්‍යාංශය විසින් දරා තිබුණි. | යුද්ධය අවසන් වී වසර **14** ක කාලයක් ගතවුවද කඳවුරු වල වෙසෙන පවුල් වලට අයත් ඉඩම් නිදහස් කිරීම, ඔවුන්ට අවශ්‍ය නිවාස ඉදිකර දීම වැනි හේතුසාධක මත එම කඳවුර වසා දැමීම ප්‍රමාද වී ඇත. | නැවත පදිංචි කිරීමේ කටයුතු කඩිනමින් අවසන් කල යුතු බව. |

### 3.4 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **2021** ජුලි **20** දින වන විට වැඩ අවසන් කරන ලද, ඇස්තමේන්තුගත වටිනාකම රු.මිලියන **295.65** ක් වූ සඳුන් උයන ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා අමාත්‍යාංශය විසින් රු.මිලියන **221.89** ක වියදමක් දරා තිබුණි. නමුත් මෙම උද්‍යානයේ ඉදිකර තිබුණු එලිමහන් වේදිකාව, කිසිදු ප්‍රයෝජනයකට නොගෙන නිෂ්කාර්යයව පැවතිනි. | පුද්ගලයන් සහ ආයතන මගින් ලැබෙන ඉල්ලීම් අනුව එළිමහන් වේදිකා කුලී පදනම මත ලබා දීම මේ දක්වා සිදු කරමින් පවතී. | එළිමහන් වේදිකාව කුලී පදනම මත ලබා දී ආදායම් ඉපැයීමට අවධානය යොමු විය යුතු බව. |
| (ආ) | ඇස්තමේන්තුගත මුදල රු.මි. **19,127** ක් වූ අරුවක්කාලු සනීපාරක්ෂක කසළ රැඳවුම් ව්‍යාපෘතිය **2018** ජනවාරි **01** දින ආරම්භ කර **2019** ජුනි **30** වන විට අවසන් කිරිමටද පැකේජ **04** ක් යටතේ ක්‍රියාත්මක කිරීමටද සැලසුම් කර තිබුණි. එම ව්‍යාපෘතියේ කසළ හුවමාරු මධ්‍යස්ථානය , සනීපාරක්ෂක බිම් පිරවුම ඉදිකිරීම සහ දුම්රිය මාර්ග දීර්ඝ කිරීම යන පැකේජ **03** හි ඉදිකිරීම් කටයුතු චීන සමාගමක් වෙත පවරා තිබුණු නමුත් එම ඉදිකිරීම් කටයුතු සමාලෝචිත වර්ෂය අවසන් වන විටද නිම කර නොතිබුණි. අවශ්‍ය කරන යන්ත්‍රෝපකරණ මිලදී ගැනීමේ පැකේජය යටතේ, දුම්රිය එන්ජින් කට්ටල **04** ක් රු.මි.**8.27** ක් වැයකර **2019** දෙසැම්බර් **31** වන විට ආනයනය කර වසර **03** ගතවී තිබුණු අතර බහාලුම් පෙට්ටි **94** ක් ඇ.ඩො.මි. **0.8**ක් වැයකර **2022** අප්‍රේල් **22** දින ආනයනය කර ගබඩා කර තිබුණි. දුම්රිය වැගන් **34** ක් ඇ.ඩො.මි.**2.3**ක වටිනාකමකට ඉන්දියන් සමාගමකින් ආනයනය කර ගැනීම සඳහා **2019** ඔක්තෝබර් **21** දින ගිවිසුම් අත්සන් කර තිබුණද අදාල ආයතනය විසින් ගිවිසුම | ආයතන **3** ක් **EOI** ඉදිරිපත් කල අතර ඒවා ඇගයීමෙන් අනතුරුව නැවත **2024.03.22** දින **CANC** ඉදිරිපත් කරන ලදී.<br>ඒ අනුව යෝජනා සඳහා ඉල්ලීම් **(RFP)** කැඳවීම සඳහා මේ වන විට අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කරන ලදී. | ව්‍යාපෘතියෙන් අපේක්ෂිත ප්‍රතිලාභ මහජනයාට කඩිනමින් ලබදීම සඳහා පියවර ගත යුතු බව. |

ප්‍රකාරව ව්‍යුහාත්මක සංකල්පීය සැලැස්ම ඉදිරිපත් නොකිරීම නිසා ගිවිසුම නිෂ්ක්‍රිය කර තිබුණු බැවින් සමාලෝචිත වර්ෂාවසානය වන විටද දුම්රිය වැගන් සපයාගැනීමට නොහැකි වී තිබුණි. කෙසේ වුවද මෙම ව්‍යාපෘතිය සඳහා **2023** දෙසැම්බර් **31** දිනට රු.මිලියන **24,016** ක් වැය කර ලබා තිබූ භෞතික ප්‍රගතිය සියයට **92** ක් විය. මෙහි කටයුතු නිම කර රාජ්‍ය - පෞද්ගලික හවුල්කාරීත්වය මත මෙහෙයුම් කටයුතු ආරම්භ කිරීමට සැළසුම්කර තිබුණ ද**,** අමාත්‍යාංශය විසින් මෙතෙක් එය ක්‍රියාත්මක කර නොතිබුණි.

**3.5 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම**

| | **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | ඇස්තමේන්තුගත වටිනාකම රු.මිලියන 10 ක් වූ දවුලුගල සතිපොල සංවර්ධන ව්‍යාපෘතිය 2022 අප්‍රියෙල් 17 දින වැඩ අවසන් කල යුතු විය. 2022 දෙසැම්බර් 31 වන විට ලබා ගෙන තිබූ භෞතික ප්‍රගතිය සියයට 40 ක් වූ අතර 2023 වර්ෂය තුලදී රු.මිලියන 1.57ක් වැයකර තිබුණි. නමුත් මෙම ව්‍යාපෘතිය අත්හිටුවා තිබූ අතර ඒ හේතුවෙන් දරන ලද වියදම නිෂ්කාර්යය වී තිබුණි. | එය මහා භාණ්ඩාගාරය විසින් නිකුත් කරන ලද අංක 3/2022, 4/2022, 5/2022 යන චක්‍රලේඛ අනුව**,** පැවති මට්ටමින් අවසන් කරන ලදී. | ආරම්භ කරන ලද ව්‍යාපෘතිවලට අරමුදල් සපයාගෙන ව්‍යාපෘති සම්පූර්ණ කර ප්‍රතිලාභීන්ට ලබා දිය යුතු බව. |
| (ආ) | 2023 දෙසැම්බර් 15 වැඩ අවසන් කල යුතුව තිබුණු අම්පාර සතිපොල සංවර්ධන ව්‍යාපෘතියෙහි ඇස්තමේන්තුගත වටිනාකම රු.මිලියන 207.6 ක් වූ අතර 2022 දොසැම්බර් 31 දින වන විට රු. මිලියන 40.63 ක වියදමක් දරා ලගා කර ගෙන තිබුණු භෞතික ප්‍රගතිය සියයට 52 ක් පමණක් විය. 2023 වර්ෂයේ මෙම ව්‍යාපෘතියේ කිසිදු කටයුත්තක් සිදුකර නොතිබුණු අතර ප්‍රධාන මහජන අවශ්‍යතාවයක් වෙනුවෙන් මෙතෙක් දරන ලද පිරිවැය නිෂ්කාර්යය වියදමක්ව තිබුණි. | කොන්ත්‍රාත්කරු හා නාගරික සංවර්ධන අධිකාරිය අතර, යම් ගැටලු සහගත තත්වයක් පැන නැගී ඇති අතර, කොන්ත්‍රාත්කරු විසින් විනිශ්චයකරු (adjudicator)වෙත යාම සඳහා දැනට කටයුතු කරමින් පවතී. | ව්‍යාපෘතිය සම්පූර්ණ කර අපේක්ෂිත ප්‍රතිලාභ ලබා කරගත යුතු බව. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | මධ්‍යම ආදායම් නිවාස ව්‍යාපෘතිය යටතේ මැදි ආදායම් ලාභීන්ගේ දායකත්වය මත නිවාස ඉදිකිරීම් ව්‍යාපෘති 12ක් 2020 හා 2021 වර්ෂවලදී ආරම්භ කර තිබුණි. නිවාස ඒකක 2,939කින් යුත් නිවාස ව්‍යාපෘති 09 ක් සඳහා 2023 දෙසැම්බර් 31 දින වන විට රු.මිලියන11,353.15 ක වියදමක් දරා තිබුණි. එසේ වුවද, 2022 දෙසැම්බර් 31 දිනෙන් පසු මෙම ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු ක්‍රියාත්මක තත්වයේ නොවුණි. | ව්‍යාපෘති 04 ක් ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2022 උපදෙස් අනුව නතර කර ඇත. ව්‍යාපෘති 02ක නිවාසවල මිල ගණන් ඉහළ යාම හේතුවෙන් නිවාස මිලදී ගැනීමට ගැණුම්කරුවන් ඉදිරිපත් නොවීය. එක් ව්‍යාපෘතියක වැඩ 2024.05.05 දින අවසන් කර ඇත. එක් ව්‍යාපෘතියක ඉදිකිරීම් කටයුතු අවසන් කර ඇති අතර අඩුපාඩු සකස් කිරීම සිදු වෙමින් පවතී. | ව්‍යාපෘතිය සම්පූර්ණ කර අපේක්ෂිත ප්‍රතිලාභ ලබා කරගත යුතු බව. |
| (ඈ) | නාගරික පුණර්ජීවන ව්‍යාපෘතිය යටතේ අඩු අදායම් ලාභීන් වෙනුවෙන් කොළඹගේ මාවත නිවාස 615 ක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය රු.මිලියන 2,546.10 ක ඇස්තමේන්තු වටිනාකමක් මත 2014 ඔක්තොම්බර් 30 දින ඉදිකිරීම් කටයුතු ආරම්භ කර තිබුණි. නමුත් 2020 නොවැම්බර් 20 දින වන විට එහි භෞතික ප්‍රගතිය සියයට 39 කදී වැඩකටයුතු අත්හිටුවා තිබුණි. එදින වන විට සංස්ථාව විසින් රු.මිලියන 1,255.30 ක් හෙවත් මුළු වටිනාකමින් සියයට 49 ක් වැය කර තිබුණි. වසර 3 ක සිට එමගින් කිසිදු ඵලදායි ප්‍රයෝජනයක් ලබාගෙන නොතිබුණු බැවින් උක්ත ව්‍යාපෘතිය සඳහා දරණ ලද රු.මිලියන 1,255.30 ක මුදල නිශ්කාර්ය වී තිබුණි. | අදහස් දක්වා නොමැත. | ව්‍යාපෘතිය සම්පූර්ණ කර අපේක්ෂිත ප්‍රතිලාභ ලබා කරගත යුතු බව.. |

### 3.6 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

| | **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | යාපනය නගර සභා ගොඩනැගිල්ල නැවත ගොඩනැගීම සඳහා රු.මිලියන 2,142.48 ක කොන්ත්‍රාත් වටිනාකමකට ඉංජිනියරිං සර්විසස් පුද්ගලික සමාගම වෙත පවරා තිබුණි. ව්‍යාපෘතිය 2019 ඔක්තෝබර් 10 දින ආරම්භ කර 2021 ඔක්තෝබර් 09 දින නිම කිරීමට සැලසුම් කර තිබුණු නමුත් නියමිත කාල සීමාව තුල ඉදිකිරීම් කටයුතු | **RAMP** තීරණය මත මෙම ව්‍යාපෘතිය යාපනය නගර සභාව විසින් භාරගැනීම ප්‍රතික්ෂේප කිරීම හේතුවෙන් **RAMP** කමිටුව විසින් නැවත රැස්වීමක් කැඳවන ලදී. එහිදී ව්‍යාපෘතිය නිම කිරීම සඳහා සුදුසු විසඳුමක් සලකා බලන ලෙස දැනුම් දෙන ලදී.<br><br>ඒ අනුව අදියර 1 වශයෙන් හඳුනාගත් | මහා පරිමාණ ව්‍යාපෘති නැවත ක්‍රමෝපායකරණය සහ වේගවත් කිරීම පිළිබඳ කමිටුවේ **(RAMP)** නිර්දේශ ක්‍රියාත්මක කල යුතු බව. |

| | | | |
|---|---|---|---|
| | නිම කිරීමට නොහැකිවී තිබුණු බැවින් 2024 ඔක්තෝබර් 09 දින දක්වා දින 1,125 ක දින දීර්ඝ කිරීම් 04 ක් ලබා දී තිබුණි. තවද 2023 දෙසැම්බර් 31 වන විට එහි භෞතික කාර්යසාධනය සියයට 66 ක් වූ අතර මූල්‍ය කාර්යයසාධනය රු.මිලියන 1,636.15 ක් විය. මෙම ව්‍යාපෘතියේ කොන්ත්‍රාත් විටිනාකම රු. මිලියන 3,769 දක්වා රු.මිලියන 1,627කින් වැඩිකිරීමට කටයුතු කර තිබුණි. කොන්ත්‍රාත් පරිපාලන සහ උපදේශන ඒකකවල අසාර්ථක අධීක්ෂණය ඊට හේතු වී තිබුණි.<br><br>මහාපරිමාණ ව්‍යාපෘති නැවත ක්‍රමෝපායකරණය සහ වේගවත්කිරීම(**RAMP**) සම්බන්ධව 22/1286/604/022 හා 2022 සැප්තැම්බර් 05 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මගින් ලබාදී ඇති නියෝග පරිදි මෙම ව්‍යාපෘතියේ ඉතිරි වැඩ කොටස් නිම කිරීමේ වගකීමත් සමගම සමස්ථ ගොඩනැගිල්ල යාපනය නගර සභාවට පැවරීමට තීරණය කර තිබුණද ඒ අනුව කටයුතු කර නොතිබුණි. | කොටස පමණක් නිමකර සම්පූර්ණ ව්‍යාපෘතියම යාපනය මහනගර සභාවට භාරගැනීමට එකඟත්වයට භාරදීමට සැලසුම් කරන ලදී. | |
| (ආ) | කඩ කාමර 258 ක් සහිත පානදුර පොදු වෙළෙඳපොල සංකීර්ණය ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව, මූලික ලංසු සුදුසුකම් පරීක්ෂාවේදී ප්‍රතික්ෂේප වූ කොන්ත්‍රාත් ආයතනය වෙත රු. මිලියන 385 (වැට් රහිත) කට 2021 සැප්තැම්බර් 23 දින පිරිනමා තිබුණු අතර 2023 මාර්තු 24 දින අවසන් කල යුතුව තිබුණි. නමුත් ඒදිනට වැඩ අවසන් නොකිරීම නිසා 2024 ජනවාරි 15 දින දක්වා දින 297 ක් දින දීර්ඝ කිරීම් ලබාදී තිබුණි. ඉදිකිරීම් කටයුතු නිසි පරිදි අධීක්ෂණය හා මෙහෙයවීම කෙරෙහි අමාත්‍යාංශයේ අවධානය යොමුවී නොතිබුණු බැවින් සංශෝධිත කොන්ත්‍රාත්කාලය තුළ දී ද ඉදිකිරීම් කටයුතු නිම කළ නොහැකි වී තිබුණි. | මෙම ව්‍යාපෘතිය මේ වන විට නිසියාකාරව ක්‍රියාත්මක වෙමින් පවතින අතර, නිසි ලෙස අධ්‍යයනය කරන ලද කාලය දීර්ඝ කිරීමේ ඉල්ලීම අනුමැතිය සඳහා යොමු කර ඇත. | ව්‍යාපෘතිවල ඉදිකිරීම් කටයුතු මෙහෙයවීම හා අධීක්ෂණය කෙරෙහි අමාත්‍යාංශයේ අවධානය යොමු කර නියමිත කාලය තුල වැඩ නිමකරවා ගැනීමට කටයුතු කල යුතු බව. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | රුපියල් මිලියන 8,413 ක භාණ්ඩාගාර ප්‍රතිපාදන යටතේ අඩු ආදායම් පවුල් සඳහා නිවාස ඒකක 14,022 ක් "ඔබට ගෙයක් රටට හෙටක් ව්‍යාපෘතිය" යටතේ ඉදිකිරීමට යෝජිත විය. මෙම ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු 2022 දෙසැම්බර් වන විට අවසන් කල යුතු වුව ද රු.මිලියන 7,704.95 ක් වැය කර 2023 දෙසැම්බර් 31 දින වන විට ද සියයට 79 ක ප්‍රගතියක් හෙවත් නිවාස ඒකක 7,744 ක් පමණක් ඉදිකර තිබුණු අතර නිවාස ඒකක 75 ක් ඉදිකිරීම අත්හිටුවා තිබුණි. | භාණ්ඩාගාරයෙන් නිසි පරිදි ප්‍රතිපාදන නොලැබීම මත නියමිත වසර තුළ සම්පූර්ණ නිවාස ගණන නිමකල නොහැකි විය. | සැලසුම් කළ පරිදි කාලීනව ව්‍යාපෘති සම්පූර්ණ කල යුතු බව. |
| (ඈ) | 2023 වසරේදී නිවාස ඒකක 500 ක් ඉදිකිරීම සඳහා රු.මිලියන 375 ක් වෙන්කර තිබුණද, එහි භෞතික ප්‍රගතිය සියයට 5 පමණ ඉතා අඩු ප්‍රතිශතයක් විය. මේ අනුව ඉහත කී නිවාස ව්‍යාපෘති මගින් අපේක්ෂිත ප්‍රතිලාභ අඩු ආදායම් පවුල් සඳහා ලැබී නොතිබුණි. | රු. 750,000 ක් වැනි මුදලකට පවතින පිරිවැය මත නිවසක් ඉදිකිරීමට නොහැකි වීම මත එම වැඩසටහනට ප්‍රතිලාභීන් ඉදිරිපත් නොවීය. එබැවින් අවශ්‍ය ප්‍රතිලාභීන් සංඛ්‍යාව හඳුනාගත නොහැකි විය. | නිසි අධ්‍යනයනයක් සිදු කිරීමෙන් අනතුරුව පමණක් ව්‍යාපෘති ආරම්භ කල යුතු බව. |
| (ඉ) | නිවාස හා ඉදිකිරීම් අංශය මගින් සියපත මරදගහමුල්ල නිවාස ඒකක 40 ක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය හා කටාන පොලිස් අභ්‍යාස ආයතනයේ නේවාසිකාගාරය ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා පිළිවෙලින් රු.මිලියන 110.66 ක් හා 132.8 ක් වැයකර ලබාගෙන තිබුණු භෞතික ප්‍රගතිය පිලිවෙලින් සියයට 35 ක් සහ 31 ක් පමණක් විය. 2023 වසරේදී මෙම ව්‍යාපෘතිවල කටයුතු අත්හිටුවා තිබුණු බැවින් අමාත්‍යාංශය විසින් මෙතෙක් දරන ලද රු.මිලියන 243.46 ක වියදම නිශ්කාර්ය වියදමක් වී තිබුණි. | මරදගහමුල නිවාස ව්‍යාපෘතිය ඉදිකරගෙන යාමේදී නිවාසයන්හි ඉදිකිරීම් පිරිවැය වැඩිවී ඇති අතර ඒ අනුව නිවාසයන්හි විකුණුම් මිල සංශෝධනය කිරීමටත්, මහල් සංඛ්‍යාව **04** දක්වා අඩු කිරීමටත් තීරණය විය. | ව්‍යාපෘති කඩිනමින් සම්පූර්ණකර අපේක්ෂිත ප්‍රතිලාභ ලබා කරගත යුතු බව. |
| (ඊ) | සියක් නගර නාගරික යටිතල පහසුකම් හා නාගරික සංවර්ධන වැඩසටහනෙහි 2023 ජනවාරි 01 දින වන විට වැඩ අවසන් කරන ලද ව්‍යාපෘති 130 ක් සඳහා 2023 වාර්ෂික ප්‍රතිපාදන මඟින් රු.මිලියන 11,105.86 ක වියදමක් දරා තිබුණි. | ව්‍යාපෘතිය සැලසුම් කිරීමේදී තිබූ ඉංජිනේරු ඇස්තමේන්තුවට වඩා මිල වැඩිවීමක් කොන්ත්‍රාත් ප්‍රධානය කිරීමේදී සිදු වීම නිසා ව්‍යාපෘති වල මිලගණන් වෙනස්වීම් සිදු විය. | ව්‍යාපෘතිවල වැඩ අවසන් කර ප්‍රතිලාභීන්ට කඩිනමින් භාර දිය යුතු බව. |

| | | | |
|---|---|---|---|
| | එම ව්‍යාපෘති අතරින් ව්‍යාපෘති 53 ක වැඩ අවසන් කර වර්ෂ 2 කටත් අධික කාලයක් ගත වී තිබුණු අතර ඒ වන විට වගකීම් කාලය ද ඉක්මවා ගොස් තිබුණද, අදාල ආයතන වෙත භාරදීමට කටයුතු කර නොතිබුණි. ඉහත ව්‍යාපෘතිවලින් ව්‍යාපෘති 110 ක් සඳහා තවදුරටත් රු.මිලියන 1,240.09 ගෙවිය යුතුව තිබුණි. එමෙන්ම TEC වටිනාකම අභිබවා රු.මිලියන 113.76 ක් ගෙවා තිබුණු ව්‍යාපෘති 14 ක්ද පැවතුණි. | | |

**3.7 මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සියක් නගර සංවර්ධන වැඩසටහන යටතේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කල ඇස්තමේන්තුගත වටිනාකම රු.මිලියන 621.62 ක්වූ සංවර්ධන ව්‍යාපෘති 05 ක් සඳහා නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය විසින් රු.මිලියන.71.24 ක් වැය කර තිබුණද, කිසිදු භෞතික කාර්යයසාධනයක් ලබා කර ගෙන නොතිබීම මතබේදාත්මක විය. | මෙම ව්‍යාපෘතිය සඳහා පසුගිය සමයේ පැවති කෝවිඩ් වසන්ගතය හා අමුද්‍රව්‍ය හිඟය හා ඒවායේ මිල අනපේක්ෂිත ලෙස ඉහල යෑම වැනි කරුණු බලපා තිබුණි. | ව්‍යාපෘති කාලීනව අවසන් කර අපේක්ෂිත ප්‍රතිලාභ ලබා කරගත යුතු බව. |

**3.8 දේශීය අරමුදල්වලින් ක්‍රියාත්මක කළ ව්‍යාපෘති**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ව්‍යාපෘතියේ වත්කම් ඌණ උපයෝජනය/ නිෂ්ක්‍රියව පැවැතිම | | |
| (i) | 2019 සැප්තැම්බර් 30 වැඩ අවසන් කළ වටිනාකම රු. මිලියන 370 ක් වූ මහර පරිපාලන හා වාණිජ සංකීර්ණයේ ඉදිරිපස කඩකාමර සහ සියලු පහසුකම් සහිත භෝජනාගාරය වසර 05ක් පමණ නිශ්කාර්යව පැවතුණි. සෝපාන යන්ත්‍ර දෙක සහ සියලු පහසුකම් සහිත ආසන 428 කින් සමන්විතව ශ්‍රවනාගාරය වැඩ නිමකල දින සිට කිසිදු ප්‍රයෝජනයකට ගෙන නොතිබුණි. ගොඩනැගිල්ලේ අකුණු සන්නායක මෙන්ම විද්‍යුත් පරිපථ | මහර ප්‍රදේශයේ එවකට පැවති අඩුපාඩුවක් වූ රාජ්‍ය ආයතන සහ පොදු කටයුතු සඳහා විධිමත් ස්ථානයක් නොමැතිවීමේ අඩුව මඟහරවා ගැනීමට එවකට ප්‍රාදේශීය සභාව සතු ගොඩනැගිල්ල පැවති ස්ථානයේ බහු කාර්යය ගොඩනැගිල්ලක් ඉදිකිරිමට යෝජනා කර ඇත. | ගොඩනැගිල්ලේ ඉදිකිරීම් අඩුපාඩු නිවැරදි කර එය ඵලදායීව උපයෝජනය කර රජයට වාසිදායක වන පරිදි ආදායම් උත්පාදනය කළ යුතු බව. |

| | | | |
|---|---|---|---|
| | කිසියම් පිරිසක් විසින් ගලවා ගෙන ගොස් තිබුණි. 2023 ජුනි 06 දින කොන්ත්‍රාත්තුවේ රැඳවුම් මුදල් වෙනත් ව්‍යාපෘති වෙනුවෙන් ගෙවිය යුතු බිල්පත් හා රැඳවුම් මුදල් වෙනුවෙන් හිලව්කර තිබුණි. මෙකී ගොඩනැගිල්ල ප්‍රයෝජනයට නොගෙන නිෂ්කාර්යව පැවතීම රාජ්‍ය මුදල් අකාර්යක්ෂම ලෙස පරිහරණය කිරීමක් වන අතර මේ සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් මෙතෙක් කිසිදු පියවරක් ගෙන නොතිබුණි. | | |
| (ii) | බෙලිඅත්ත අම්පිටිය වැව ඇව්දින මංතීරු ඉදිකිරීම හා භූදර්ශන වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය රු.මිලියන 65.77 වැඩ වටිනාකමක් මත 2022 අගෝස්තු 30 දින වැඩ අවසන් කර තිබුණි. ව්‍යාපෘතිය අවසන් කර බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව වෙත භාරදිය යුතු වුවද ප්‍රවිශ්‍ය මාර්ගය වල් බිහි වීම, ඇව්දීමේ මංතීරුව පුරා ඇව්දීමට අපහසු ලෙස මඩ සහිත වල ගොඩැලි තත්වයක් පැවතීම,වැව වටා ඉදිකර ඇති බෝක්කු පද්ධතියේ දුර්වලතා නිසා වැව තුලට ජලය ගලා ඒමේ දුර්වලතා පැවතීම පෞද්ගලික ඉඩම් තුල ජලය රැඳී තිබීම ආදී දුර්වලතාවයන් පැවතීම නිසා ප්‍රාදේශීය සභාව විසින් මෙම ව්‍යාපෘතිය භාර ගැනීම ප්‍රතික්ෂේප කර තිබුණි. එබැවින් උක්ත ව්‍යාපෘතිය කිසිදු ඵලදායී ප්‍රයෝජනයකට නොගෙන වසර 02 ක් පමණ නිශ්කාර්යයව පවතීම හේතුවෙන් මේ සඳහා වැයකල රු. මිලියන 65.77 ක මුදල ඵලරහිත වියදමක් වී තිබුණි. | එවකට සිටි සභාපති විසින් විවිධ අඩුපාඩු පවසමින් ව්‍යාපෘතිය භාරගැනීම මග හැර ඇත. කෙසේ වෙතත් නාගරික සංවර්ධන අධිකාරියේ මූලිකත්වයෙන් 2024 මැයි මස 03 දින ක්ෂේත්‍ර පරීක්ෂාවක් සිදු කරන ලදී. එහිදී හඳුනාගත් සුළු ගැටළුකාරී තත්වයන් නිරවුල් කිරීමට අදාළ පාර්ශවයන් එකඟතාවය පල කරන ලදී. එම ගැටළු නිරවුල් වූ වහාම බෙලිඅත්ත ප්‍රාදේශීය සභාවේ වත්මන් කළමනාකාරිත්වය ව්‍යාපෘති භාර ගැනීමට කැමැත්ත ප්‍රකාශ කරන ලදී. | පවතින ගැටළු කඩිනමින් විසඳා ඉදිකිරීම් ඵලදායීව ප්‍රයෝජනයට ගතයුතු බව. |

## 3.9 ප්‍රසම්පාදනයන්

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3.1 ප්‍රකාරව සියළුම ආශ්‍රිත වියදම් ඇතුළු මුළු පිරිවැය ඇස්තමේන්තුවද 2.3.1 (අ) ප්‍රකාරව ආරම්භක පාරිසරික පරීක්ෂණය, පාරිසරික බලපෑම් පිළිබඳ තක්සේරුව, සමාජ බලපෑම් පිළිබඳ තක්සේරුවද ප්‍රසම්පාදන අස්රීත්වය විසින් පිළියෙල කල යුතු වුවත් කොන්ත්‍රාත් වටිනාකම රු.මිලියන 120.7 ක් වූ හෝල්ලුවාගොඩ කෘෂි පාරිසරික උද්‍යාන ව්‍යාපෘතිය සහ කොන්ත්‍රාත් වටිනාකම රු.මි.795.5 ක් වූ බොරලැස්ගමුව බහුකාර්ය ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා එම වාර්තා සකස්කර අනුමැතිය ලබාගෙන නොතිබුණි. | සියලු ප්‍රසම්පාදන කටයුතු එවකට මහ නගර සභා හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය මගින් සිදු කරන ලදී. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කල යුතු බව. |
| (ආ) | රු.මිලියන 445 ක අයවැය ප්‍රතිපාදන මත මහර පරිපාලන හා වාණිජ සංකීර්ණය, ඉදිකිරීමට කටයුතු කර ඇති නමුත් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.3.1 (අ) පරිදි මෙම ගොඩනැගිල්ල ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට ප්‍රථම මූලික සක්‍යතා අධ්‍යනයක් සිදුකර නොතිබුණු අතර 4.3.1 පරිදි සියලුම ආශ්‍රිත වියදම් ඇතුළු මුළු පිරිවැය ඇස්තමේන්තුවක් ප්‍රසම්පාදන අස්රීත්වය විසින් පිළියෙල කර නොතිබුණි. | මූලික අවස්ථාවේ මිලියන **455** මුළු වියදම දල ගණනය කිරීමෙන් අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව ප්‍රතිපාදන ලැබෙන ආකාරය අනුව, සැලසුමේ කොටස් නිම කිරීම සඳහා අදියර වශයෙන් විස්තරාත්මක ප්‍රමාණ පත්‍ර සකස් කර ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුව කටයුතු කළ යුතු බව. |

**3.10 වත්කම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2017 දෙසැම්බර් 21 දිනැති අංක 02/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 2(i) ඡේදය ප්‍රකාරව, ලියාපදිංචි අයිතිය නොමැතිව පරිහරණය කරනු ලබන වාහන, තම ආයතනයේ නමින් ලියාපදිංචි කරගැනීමට හෝ ලියාපදිංචි අයිතිය හිමි ආයතනය වෙත විධිමත්ව පැවරීමට කටයුතු කල යුතු වුවද, නීත්‍යානුකූල හිමිකම අමාත්‍යාංශය සතු නොවූ රු. මිලියන 414.81 ක් වටිනාකමැති වාහන 31 ක් අමාත්‍යාංශය විසින් පරිහරණය කරනු ලැබීය. | එම වාහන වල හිමිකම් පවරා ගැනීමේ ගැටළු පැවතීම නිසා නීත්‍යානුකූල හිමිකම පවරා ගැනීමට ප්‍රමාද වී ඇත. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතු බව. |
| (ආ) | සියක් නගර වැඩසටහන යටතේ අමාත්‍යාංශ ප්‍රතිපාදන මත සිදු කරන ලද රු.මිලියන 8,845 ක් වටිනා ව්‍යාපෘති 29 ක් නීත්‍යානුකූලව අදාල ආයතනයන්ට භාර දී නොතිබුණි. එමෙන්ම එම වත්කම් කිසිදු ආයතනයක ගිණුම් ප්‍රකාශන වල ඇතුළත් නොවීම හේතුවෙන් මෙම වත්කම් ගිණුම්වලින් අත්හැරීමට හැකියාවක් පවතුණි. | මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කරන අවස්ථාවේ අදාල ආයතන භාර ගැනීමට එකඟතාව ලබා දී ඇතත් ඉදිකිරීමේ අවසන් කිරීමෙන් පසු යම් යම් ගැටලු ඉදිරිපත් කරමින් එම ව්‍යාපෘති භාර ගැනීම ප්‍රමාද කරමින් සිටී. | වත්කම් නීත්‍යානුකූලව භාරදිය යුතු බව. |

**3.11 අනාර්ථික ගනුදෙනු**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | බෙලිඅත්ත අම්පිටිය වැව ඇවිදින මංතීරුව ඉදිකිරීම හා භූදර්ශන වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය රු.මිලියන 79.56 ක වටිනාකමක් මත ඉදිකිරීම සඳහා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව වෙත ලබා දී තිබුණු අතර එම සංස්ථාව විසින් කිසිදු අනුමැතියකින් තොරව මෙම කොන්ත්‍රාත්තුව රු.මිලියන 10.15 ක ලාභාන්තිකයක් තබාගෙන රු.මිලියන 69.41 ක වැඩ වටිනාකමක් මත සී/ස ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සමාගම වෙත උප බඳු දී තිබුණි. | අදහස් දක්වා නොමැත. | උප කොන්ත්‍රාත් ලබාදීමට විධිමත් අනුමැතියක් ලබාගත යුතු බව. |

| | | | |
|---|---|---|---|
| (ආ) | හෝලුවාගොඩ කෘෂි පාරිසරික උද්‍යාන ව්‍යාපෘතිය ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව වෙත සෘජු කොන්ත්‍රාත් ක්‍රමය යටතේ ලබා දී තිබුණද, කොන්ත්‍රාත්කරු විසින් අමතර ලාභයක් ලැබෙන අයුරින් ලාභ ආන්තිකයක් තබා ගෙන උප කොන්ත්‍රාත් ලබා දී තිබුණු අතර එමගින් ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව රු. මිලියන **13.36** ක මූල්‍ය ලාභයක් ලබා ගෙන තිබුණි. | එය අමාත්‍යාංශ ස්ථාවර තාක්ෂණ ඇගයීම් කමිටු කටයුතු වෙනුවෙන් **2021.01.22** දිනැතිව අමාත්‍යාංශ ලේකම් ප්‍රමුඛ කමිටුවකින් ගන්නා ලද තීරණයකි. | සෘජු කොන්ත්‍රාත් ක්‍රමය යටතේ කොන්ත්‍රාත් ලබාදුන් කොන්ත්‍රාත්කරුවන්ට අමතර ලාභ ඉපැයීම සඳහා අවස්ථාව ලබා නොදිය යුතු බව. |

## 3.12 විගණන විමසුම්වලට පිළිතුරු ලබා නොදීම

| විගණන විමසුම පිළිබඳ විස්තරය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **2018** අංක **19** දරන ජාතික විගණන පනතේ **38 (17) (ඉ)** හා **42** වගන්ති සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ **155** සහ **2012** අප්‍රේල් **09** දිනැති **PSMD/AD/2/1/1/26** දරන ජනාධිපති ලේකම් විසින් නිකුත් කර ඇති ලිපියෙහි (ආ) ඡේදය ප්‍රකාරව විගණන විමසුම්වලට අප්‍රමාදව ක්‍රියා කොට ඒවාට සම්පූර්ණ පිළිතුරු සැපයීම ප්‍රධාන ගණන්දීමේ නිළධාරීගේ හා ගණන්දීමේ නිළධාරීගේ වගකීමක් වුවද, **2023** වර්ෂයට අදාලව නිකුත්කල විගණන විමසුම් **17** කට පිළිතුරු සපයා නොතිබුණි. | මේ වනවිට පිළිතුරු සැපයිය යුතු විගණන විමසුම් සඳහා අප්‍රමාදව පිළිතුරු සැපයීමට කටයුතු කරමින් සිටී. | විගණන පනතේ විධිවිධාන, මු.රෙ. හා චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතු බව. |

## 4. තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2030 වන විට සියළු දෙනාටම ප්‍රමාණවත් ආරක්ෂාකාරී සහ අඩු මිලට ලබාගත හැකි නිවාස හා මූලික සේවාවන් වෙත ප්‍රවේශය තහවුරු කිරීම සහ පැල්පත් නිවාස වැඩි දියුණු කිරීම තිරසර සංවර්ධන | අදහස් දක්වා නොමැත. | තිරසර සංවර්ධන අරමුණු අපේක්ෂිත පරිදි ලඟාකරගැනීමට විධිමත් ක්‍රියාමාර්ග ගත යුතු බව. |

අරමුණක් ලෙස හඳුනාගෙන තිබුණද, සමාලෝචිත වර්ෂය තුළදී සියයට 49 කට වඩා අඩු ප්‍රගතියක් ලඟාකර ගෙන තිබුණි.

**5.** **මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (ආ) | නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ නැවත පදිංචි කිරීමේ අංශයේ සේවය කරන සංවර්ධන නිලධාරීන් 48 ක් දිස්ත්‍රික් ලේකම් කාර්යාල 05කට හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 24කට අනුයුක්ත කර තිබුණද ඔවුන්ගේ කාර්යය සාධනය ඇගයීමට ලක්කර නොතිබුණි. | උතුරු නැගෙනහිර දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල රාජකාරී කරන ලද නිලධාරීන්ට ගෙවන ලද වැටුප් පත්‍රිකා සියල්ල අදාල නිලධාරීන් විසින් අත්සන් කර ඇති අතර, එම තොරතුරු **2024/05/27** දින විගණනයට ලබා දී ඇත. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලට අනුයුක්ත කරන ලද නිලධාරීන්ගේ කාර්යසාධන ඇගයීම සිදුකළ යුතු බව. |